# ශ්‍රී ලංකා ජාතික පෙරමුණ

හැඳින්වීම : ශ්‍රී ලංකා ජාතික පෙරමුණ යන නාමය යටතේ අප සංවිධානය වන්නේ මනුෂ්‍ය වර්ගයාගේ හා අවශේෂ සත්වයින්ගේ යහපත සඳහා ඇපකැප වී වැඩ කරන්නටය.

සෑම මිනිසකුම අනාගත පරපුරේ යහපත හා සැපත උදෙසා ක්‍රියා කළ යුතු බව අපි විශ්වාස කරමු.

මිනිසා උත්තරීතර තලයකට ගෙන ඒම අපගේ අරමුණ වන්නේය.

අපි කිසිදු ආකාරයකින් ආගම්, ජාති, කුල, භාෂා ආදී සාමාජ සංවිධාන අතර භේද ඇති කරන අයුරින් කටයුතු නොකරමු.

## ව්‍යවස්ථා මාලාව

**01 වන වගන්තිය :**

| | | | |
|---|---|---|---|
| I. | පක්ෂයේ නාමය | : | ශ්‍රී ලංකා ජාතික පෙරමුණ නම් වන්නේය. (මින් මතු පක්ෂය යනුවෙන් හඳුන්වන්නේ එයයි) |
| II. | පක්ෂයේ වර්ණය | : | මදටිය පාට |
| III. | පක්ෂයේ සලකුණ | : | ක්‍රිකට් පිත්ත |
| IV. | පක්ෂයේ මූලස්ථානය | : | ආරම්භක කාර්යාලය මරදාන වන අතර, පක්ෂය විසින් කාලය හා පහසුකම් අනුව ප්‍රකාශයට පත් කරන ස්ථානය කාර්යාලය වේ. |

**02 වන වගන්තිය :**

පක්ෂයේ අරමුණ : ජනතාවගේ ස්වාධීනත්වය ආරක්ෂා කරමින් දියුණු ජාතියක් වෙසෙන බවට ශ්‍රී ලංකාව පත් කිරීම පක්ෂයේ ඒකායන අරමුණ වන්නේය.

**03 වන වගන්තිය :**

පරමාර්ථයන් :

I. ශ්‍රී ලංකා ජාතික පෙරමුණ මූලික පරමාර්ථයන් වනුයේ බියෙන් තොරව කායික හා මානසික සුවෙන් හෙබි ජාතියක් වෙසෙන රටක් බවට ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම

හා

II. දේශීය සංස්කෘතිය හා සාරධර්ම අනුගමනය කරමින් දේශීය සම්පත් හඳුනාගෙන ඒවා සංවර්ධනය කොට ප්‍රජාවගේ ආර්ථිකය නැංවීමට ක්‍රියා කිරීම පක්ෂයේ පරමාර්ථයන් වන්නේ ය.

04 වන වගන්තිය :

ප්‍රතිපත්ති :

I. පක්ෂයේ මූලික ප්‍රතිපත්තිය වනුයේ සෑම කල්හිම ජනතාවගේ සකලවිධ අයිතිවාසිකම් ආරක්ෂා වන ආකාරයට අව්‍යාජ, ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන මූලධර්ම මත පිහිටුවා ක්‍රියා කිරීම වන්නේය.

II. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන මූලධර්ම වශයෙන් අප සළකණු ලබනුයේ "මිනිසා සතු පූර්ණ නිදහස පිළිබඳ හැඳින්වීමක් වශයෙනි". එනම් සිතීමේ නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, රැස්වීමේ නිදහස, ආගම ඇදහීමේ නිදහස, ඡන්දය දීමේ නිදහස හා ඡන්ද අපේක්ෂකයෙකු වීමේ නිදහස, බියෙන් සැකෙන් තොරව ජීවත් වීමේ අයිතිය හා නිදහස ඇතුළු මිනිසා සතුව තිබිය යුතු පෞද්ගලික නිදහස

හා

III. නිදහස් ඡන්දයෙන් තෝරා පත්කරගනු ලබන මහජන නියෝජිත මණ්ඩලයේ (පාර්ලිමේන්තුවක්) මගින් පාලනය කිරීම හා අධිකරණයේ ස්වාධීනත්වය ද ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන මූලධර්ම වශයෙන් පක්ෂය පිලිගනු ලැබේ.

IV. කිසිම බල කඳවුරකට අත්තනෝමතික ලෙස ගැති නොවීම හා නොබැඳි විදේශ ප්‍රතිපත්තියේ පිහිටා ක්‍රියා කිරීම අප පක්ෂයේ ස්ථාවරය වන්නේ ය.

V. අප පක්ෂය මොනම අවස්ථාවකදීවත් භීෂණය, දූෂණය හා පලිගැනීම අනුමත නොකරන අතර, එවැනි වැරදි ක්‍රියාවක් කවුරුන් වෙතින් සිදු වූවත් තරාතිරම හෝ සම්බන්ධතාවය නොතකා නීතිය අභිමුඛයට පමුණුවා යුක්තිය හා සාධාරණය ඉටු කිරීම අප පක්ෂයේ අව්‍යාජ දේශපාලන ප්‍රතිපත්තියේ අංග ලක්ෂණය බැව් ගෞරව පූර්වකව ප්‍රජාව ඉදිරියේ ප්‍රකාශ කර සිටිමු.

05 වන වගන්තිය :

පක්ෂ සංවිධානය : ශ්‍රී ලංකා ජාතික පෙරමුණ පහත දැක්වෙන සංවිධාන වලින් යුක්ත වේ.

(අ) I. පක්ෂ නායකත්වය : පක්ෂයේ නායක ධූරය පක්ෂයේ ඉහලම නිලය වන අතර, පක්ෂයේ සියළුම ක්‍රියාදාමයන් නායකත්වයේ අනුමැතිය පරිදි විය යුතුය.

II. පක්ෂයේ මධ්‍යම කාරක සභාව

III. විධායක සභාව (විනය මණ්ඩලය, හා පරීක්ෂණ කමිටුව)

IV. උපදේශක මණ්ඩලය

V. බුද්ධි මණ්ඩලය

VI. දිස්ත්‍රික් කාරක සභාව

VII. මැතිවරණ බල ප්‍රදේශ භාර කාරක සභාව

VIII. ප්‍රාදේශීය සංවිධානය

IX. ශාඛා සමිති

(ආ) ශ්‍රී ලංකා ජාතික පෙරමුණට අනුබද්ධ සංවිධාන පිහිටුවීම.

I. පැවදි සංවිධානය
II. ගුරු සංවිධානය
III. වෘත්තීය සමිති සම්මේලනය
IV. සංස්කෘතික සංවිධානය
V. ජනමාධ්‍ය හා ප්‍රචාරක සංවිධාන
VI. ශිෂ්‍ය සංවිධාන
VII. කාන්තා සංවිධාන
VIII. නීතිඥ සංවිධාන
IX. වෛද්‍ය සංවිධාන
X. ගොවි සංවිධානය

හා

XI. විවිධ ක්ෂේත්‍ර වෙනුවෙන් සංවිධාන පිහිටුවා ගැනීමෙන් පක්ෂ සංවිධාන ව්‍යුහය ගොඩ නැගේ.

06 වන වගන්තිය :

සමිති සංවිධාන පිහිටුවීම සඳහා අනුගමනය කළ යුතු පිළිවෙත්

(අ) ශාඛා සමිති :

I. හැකි සෑම ග්‍රාමසේවා වසමකටම යටත් පිරිසෙයින් එක් ශාඛාවක් බැගින් වන පරිදි ශාඛා සමිති පිහිටුවිය යුතුය.

II. ශාඛා සමිති පිහිටුවිය යුතු ග්‍රාමසේවා නිලධාරී වසම තීරණය කරනු ලබන්නේ මැතිවරණ බලප්‍රදේශ සංවිධාන මගින් විය යුතුය.

III. ශාඛා සමිතියක් පිහිටුවීම පිණිස අඩු තරමින් 18 දෙනෙක් වත් සිටිය යුතුය.

IV. ආයතන සඳහා පක්ෂ ශාඛා පිහිටුවීම මධ්‍යම කාරක සභාවේ උපදෙස් මත විය යුතුය.

V. මොනම හේතුවක් නිසාවෙන් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් මෙම සංවිධාන වලට සම්බන්ධ කර නොගත යුතුයි.

උසස් අධ්‍යාපන (විශ්ව විද්‍යාල වැනි) ආයතන වල වයස අවු. 18 සපිරි ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් සංවිධාන පිහිටුවීම මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ඇතිව කළ යුතුයි.

(ආ) ශාඛා සමිති සඳහා නිලධාරී මණ්ඩලය

1. සභාපති
2. උප සභාපතිවරු
3. ලේකම්
4. උප ලේකම්
5. භාණ්ඩාගාරික
6. සංවිධාන හා කාරක සභිකවරු 5 දෙනෙකුගෙන් නිල මඬුල්ල සමන්විත විය යුතුයි.

සභාවේ අභිමතය පරිදි අනුශාසකවරු පත් කර ගැනීමට අවසර ඇත.

ගණපූර්ණය 6 කි.

## 07 වන වගන්තිය

සංවිධාන ව්‍යුහය -

(අ) ප්‍රාදේශීය සංවිධාන හා මැතිවරණ බලප්‍රදේශ සංවිධාන :

මධ්‍යම කාරක සභාව විසින් ප්‍රාදේශීය සංවිධායකවරු පත් කරනු ලැබේ. අදාළ ප්‍රදේශයේ ශාඛා සමිතිවල සභාපතිවරු, ලේකම්වරු රැස් කරවා ප්‍රාදේශීය සංවිධානය ගොඩ නැඟිය යුතුය. එකී සංවිධානයට ප්‍රදේශයේ වෙසෙන සුවිශේෂ පුද්ගලයන් එනම්, උගතුන්, චරිතවත්, ප්‍රදේශවාසීන්ගේ ආදර ගෞරවයට පාත්‍ර වූ පුද්ගලයින් ඇතුළු පාරම්පරික සම්බන්ධතා ඇති අය හැකි පමණ මෙම සංවිධානයට සම්බන්ධ කර ගැනීමට සංවිධායකවරයා උනන්දු විය යුතුය.
එලෙස එක්රැස් කරගත් සංවිධානය පක්ෂයේ ප්‍රාදේශීය සංවිධානය ලෙස නම් කෙරේ.

(ආ) මැතිවරණ බලප්‍රදේශය සඳහා වූ සංවිධානය :

මෙම සංවිධානය පිහිටුවීම සඳහා ප්‍රධාන ලේකම්තැනගේ අනුමැතිය පරිදි මධ්‍යම කාරකසභාව වෙත නාමයෝජනා කැඳවනු ලැබේ. එකී නාමයෝජනා ඉදිරිපත් කිරීමට ශාඛා සමිතියේ පටන් ඉහළට තිබෙන සියළුම සංවිධාන වලට විවෘතව ඉඩ ලබා දිය යුතුය.

(ඇ) දිස්ත්‍රික් සම්මේලනය :

සෑම දිස්ත්‍රික්කයකටම මධ්‍යම බල මණ්ඩලයක් පිහිටුවීම පක්ෂ මූලස්ථානයේ මධ්‍යම කාරක සභාව විසින් කරනු ලැබේ.

ඒ සඳහා එකී දිස්ත්‍රික්කයේ සංවිධාන නියෝජනය කරන සභාපතිවරු හා ලේකම්වරු රැස් කරවා මධ්‍යම කාරක සභාවේ විශේෂ නියෝජිතයෙකුගේ ප්‍රධානත්වයෙන් සංවත්සර රැස්වීමක් පවත්වා නිලධාරී මණ්ඩලය පත් කිරීම සිදු කළ යුතුය.

08 වන වගන්තිය

නිලධාරී මණ්ඩලයේ කාර්යභාරයන් ඃ

I. පක්ෂ නායකවරයා - ඔහු පක්ෂයේ නියමුවා වන්නේය. පක්ෂයේ නායකවරයා වශයෙන් සෑම අංශයක්ම පාලනය කිරීමේදී "විධාන කිරීම" උපදෙස් දීම, පක්ෂය වෙනුවෙන් දේශීය හා විදේශීය ආයතන හෝ රජයක් සමග හෝ සාකච්ඡා සඳහා පෙනී සිටීම පක්ෂ නායකත්වය වශයෙන් සලකණු ලබන්නේ ද පිළිගනු ලබන්නේ ද පක්ෂයේ නායකත්වය වේ.

II. සභාපතිවරයා - පක්ෂ නායකවරයා නැති අවස්ථාවලදී සභා රැස්වීම්වල මුලසුන ගනී. මධ්‍යම කාරකසභාවේ දී සම්මත කරන යෝජනා ක්‍රියාවට නැංවීම හා ඒ වෙනුවෙන් අත්සන් ඇතුළු විධායක කටයුතු භාරව ක්‍රියා කළ යුතුය.

III. උප සභාපතිවරු - සභාපති නැති අවස්ථාවල දී ඔහු වෙනුවෙන් වගකීම් ඉටු කිරීම, සම්මත වූ සියළු කාර්යයන් ඉටු කිරීමට ප්‍රධාන ලේකම් ඇතුළු මධ්‍යම කාරක සභිකවරුන්ට උපදෙස් දීම කළ යුතුය.

IV. ප්‍රධාන ලේකම් - සාමාජික නාමලේඛන පවත්වා ගෙන යාම, වාර්තා සම්පාදනය හා ආරක්ෂා කිරීම, පක්ෂයේ සියළු සංවිධාන සමඟ සම්බන්ධතා පවත්වා ගෙන යාම, උපදෙස් දීම, කාර්යයන් පැවරීම, පක්ෂයේ සම්පූර්ණ ලිපි ලේඛන විධිමත්ව පවත්වා ගෙන යාම, නීති අංශයේ හා බැංකු අංශයේ කටයුතු නිසි පරිදි ඉටු කිරීම ඇතුළු පක්ෂයේ සහ සාමාජිකයන්ගේ සෑම ප්‍රශ්නයක්ම ක්‍රියා කිරීම ප්‍රධාන ලේකම්වරයා සතුවේ.

රැස්වීම් කැඳවීම, වාර්තා ඉදිරිපත් කිරීම ලේකම්තැන විසින් කළ යුතුය.

V. උප ලේකම්වරු - උප ලේකම්වරු ප්‍රධාන ලේකම්ට සෑම අංශයකින්ම සහාය විය යුතු අතර, ප්‍රකාශන, ලේඛණ ආදිය අදාළ භාෂාවන්ගෙන් සංස්කරණය කරදීමට ක්‍රියා කළ යුතුය.

VI. භාණ්ඩාගාරික - පක්ෂයේ සාමාජික මුදල්, ආධාර මුදල් ඇතුළු සියළුම අරමුදල් භාරව ගණන් තැබීම, බැංකුවේ තැන්පත් කිරීම, අයවැය වාර්තා සකස් කොට අනුමැතියට ඉදිරිපත් කිරීම, ගණන් පරීක්ෂක ලවා වාර්ෂිකව අයවැය පරීක්ෂා කරවා වාර්තා මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කිරීම හා අවු. 5 කට වරක් අයවැය වාර්තාවක් සංවත්සර මහා සභාව වෙත ඉදිරිපත් කිරීම භාණ්ඩාගාරිකගේ වගකීම වන්නේය.

VII. ජාතික සංවිධායක - ජාතික සංවිධායක, දිස්ත්‍රික් සංවිධායකවරු සමඟ නිතර සම්බන්ධතා පවත්වමින් පක්ෂයේ තීරණ අනුව සංවිධාන කටයුතු මෙහෙයවීම කළ යුතුය.

09 වන වගන්තිය

ක්‍රියාකාරී කමිටුව -

පක්ෂයේ සියළුම කටයුතු මෙහෙයවනු ලබන්නේ එකී කරුණු සඳහා වූ කමිටුවල නිර්දේශ වලට අනුකූල වන පරිදි බැවින්, සමස්ථයක් වශයෙන් රටපුරාම සංවිධාන එකී නිර්දේශ මත පිහිටා ක්‍රියා කිරීම සඳහා පක්ෂයේ තීරණ එකවර රටපුරා විසුරුවා හැරීමට ක්‍රියාකාරී කමිටු ක්‍රමය අනුගමනය කළ යුතුය.

ක්ෂේත්‍රයක් සඳහාම පත් කර තිබෙන කාරක සභා හා කමිටු අදාළ විෂයයට නියමිත කරුණු පිළිබඳ වගකීම දැරිය යුතුය.

- පැමිණිලි විභාග කිරීම
- සංවිධාන කටයුතු මෙහෙයවීම
- සභා, රැස්වීම්, මහජන රැළි සංවිධානය කිරීම
- මැතිවරණ සඳහා නියෝජිතයන් තේරීම පිණිස නාම යෝජනා කැඳවීම
- දේශන සංවිධානය කිරීම ආදී සෑම වගකීමක්ම ක්‍රමවත්ව ඉටු කිරීම සඳහා ඒ ඒ කාර්යයන් සඳහා පත් කර තිබෙන කමිටු විසින් වගබලා ගත යුතුයි.
- සියළුම වගකීම්, සභා ක්‍රමයෙන්ම ඉටු කිරීමට පක්ෂය විධිවිධාන සම්පාදනය කළ යුතුයි.

10 වන වගන්තිය

මැතිවරණ කමිටු

- මැතිවරණයක දී එකී මැතිවරණය සඳහා අවශ්‍ය සියළු කටයුතු සැලසුම් කිරීම හා මෙහෙයවීම, ක්‍රියාවට නැංවීම මෙම කමිටුවට භාර වන්නේය.

මැතිවරණ කමිටුවේ සාමාජිකයන් වශයෙන් -

- පක්ෂයේ නායකතුමා, සභාපති, ලේකම් ඇතුළු නම් කර පත් කරගනු ලබන සාමාජිකයන්ගෙන් යුතු වේ.
- මේ ආකාරයට මධ්‍යම කාරකසභාවේ නිගමනය පරිදි මැතිවරණ කමිටු දිස්ත්‍රික් මට්ටමෙන් පත්කිරීමට පක්ෂයට හැකි වන්නේය.
- මැතිවරණයකට ඉදිරිපත් වීම සඳහා නියෝජිතයන් තේරීමේදී පක්ෂය වඩාත් සැලකිලිමත් විය යුත්තේ එම මැතිවරණ කොට්ඨාශයේම පදිංචි නියෝජිතවරයෙකුට ප්‍රමුඛත්වය දීම සඳහාය.
- පක්ෂයේ නියෝජිතයෙකු ලෙස මැතිවරණයකට ඉදිරිපත් වන සෑම කෙනෙකුගේම පසුගිය වර්ෂ 5 ක සාමාන්‍ය ජීවන රටාව පිළිබඳව වාර්තාවක් ප්‍රධාන ලේකම් වෙත සැපයිය යුතුය.
- නීතිවිරෝධී හෝ සමාජ විරෝධී හෝ ක්‍රියාවල හෝ සමාජ විරෝධී ව්‍යාපාරවල හෝ නියුතු වී සිටින හෝ සිටිය හෝ කිසිවෙකුට පක්ෂයේ නියෝජිතයෙකු ලෙස තරඟ කිරීමට නාමයෝජනා නොදිය යුතුය.
- කෙසේ වෙතත්, මැතිවරණයකට අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වන සෑම කෙනෙක් ගැනම පක්ෂයේ සංවිධාන මගින් රහස්‍ය වාර්තා ලබා ගැනීමට පක්ෂ නායකත්වයට නිදහස හා බලය ඇත්තේය.

11 වන වගන්තිය

අරමුදල්/ආධාර මුදල් එකතු කිරීම.

- මැතිවරණයක දී හෝ සංවත්සරයක දී හෝ මහජන රැස්වීමක දී හෝ පක්ෂයට ආධාර මුදල් එකතු කිරීම කළ හැකි වන්නේ අදාල ප්‍රදේශයේ දී සම්මත කරගත් යෝජනාවක් මැතිවරණ කමිටුව වෙත හෝ මධ්‍යම කාරක සභාව වෙත හෝ ඉදිරිපත් කර අනුමැතිය ලබාගත් පසුව විය යුතුය.

පක්ෂයේ මුදල්

- පක්ෂ නායකයා ඇතුළු සභාපති, ප්‍රධාන ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු 5 දෙනෙකුගෙන් යුත් මුදල් කාරක සභාවක් පත් කළ යුතුයි. පක්ෂයේ මුදල් පිළිගත් බැංකුවක තැන්පත් කළ යුතුයි. සියළුම වැය සඳහා මුදල් කාරක සභාවේ අනුමැතිය ලබාගත යුතුයි.

12 වන වගන්තිය

පක්ෂයේ සභා රැස්වීම

- ශාඛා සමිතියක් යටත් පිරිසෙයින් 3 මසකට වරක් වත් රැස්විය යුතුයි.
- ශාඛා සමිතිවල දී ගනු ලබන තීරණ සම්මත කෙරෙන යෝජනා පිළිබඳ සරල වාර්තාවක් පක්ෂ මූලස්ථානය වෙත එවිය යුතුයි.
- ප්‍රාදේශීය සංවිධාන රැස්වීම දිස්ත්‍රික් සංවිධානයක විසින් අවශ්‍ය අවස්ථාවල දී කැඳවිය යුතුයි.
- සමස්ත ලංකා නියෝජිත කාරකසභාවේ රැස්වීමක් යටත් පිරිසෙයින් 6 මසකට වරක් වත් රැස්විය යුතුයි.
- මධ්‍යම කාරක සභාවේ රැස්වීම් අනිවාර්‍යයෙන් මාස 2 කට වරක් වත් රැස්විය යුතු අතර, අවශ්‍ය ඕනෑම අවස්ථාවක දී හදිසි රැස්වීම් කැඳවීමට පක්ෂ නායකවරයාට බලතල ඇත්තේය.

විධායක සභාව -

- සභාපති, ප්‍රධාන ලේකම්, භාණ්ඩාගාරික හා පක්ෂ සම්මේලනයේ දී නම් කොට පත් කල 4 දෙනෙකු ඇතුලත් 7 දෙනෙකුගෙන් විධායක මණ්ඩලය සමන්විත වේ.
- විධායක සභාවේ දී සිදු කරනුයේ මධ්‍යම කාරකසභාවේ දී සම්මත කෙරුණු වැදගත් කරුණු පිළිබඳව නැවත සමාලෝචනයක් කිරීම, එහි ගුණදොස් විවාදයට ලක් කිරීම හා සංශෝධන අවශ්‍ය නම් එවනි සංශෝධන ඉදිරිපත් කර නැවත මධ්‍යම කාරක සභාවේ සැලකිල්ලට යොමු කිරීම වන අතර, පක්ෂය විසින් ගනු ලබන තීරණ අනුව පක්ෂ සංවිධානය මෙහෙයවීම සිදු කෙරේ.

ව්‍යවස්ථා සංශෝධනය -

- විධායක සභාව විසින් ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත් කළ යුතුයි. නීතිමය ප්‍රශ්න හෝ ගැටළු පැන නැගුන විට ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය පියවර ගැනීම හා පක්ෂය සතු සියළු දේපල ආරක්ෂා කිරීමට අවශ්‍ය භාරකාර මණ්ඩල පිහිටුවා එම මණ්ඩලයට උපදෙස් දීම වැනි පරිපාලන කටයුතු සම්පූර්ණයෙන් කළ යුතුයි.
- මධ්‍යම කාරකසභාව පක්ෂයේ උත්තරීතර සභාව වන අතර, ව්‍යවස්ථාවේ සඳහන් නොවන කරුණක දී අවසන් තීරණය පක්ෂ නායකත්වය සතුවේ.

විනය මණ්ඩලය -

- විනය මණ්ඩලය කොටස් දෙකකින් යුතු වේ.
  I. සාමාජිකයන් 3 දෙනෙකුගෙන් යුත් මූලික පරීක්ෂක කමිටුව
  II. තීන්දු දීම සඳහා රැස්වන අවසන් පරීක්ෂණ කමිටුව සාමාජිකයන් 3 දෙනෙකුගෙන් සමන්විත යුතු වේ.

  මෙම කමිටු දෙකෙන්ම දෙනු ලබන තීරණවලට එකඟ නොවන සාමාජිකයෙකුට අභියාචනයක් ඉදිරිපත් කළ හැක්කේ පක්ෂ නායකත්වය වෙතය. පක්ෂ නායකත්වයේ තීරණ අවසාන තීරණය වේ.

- පක්ෂයේ සියළු අංශවල දැඩි විනයක් තිබිය යුතුය. ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට මධ්‍යම කාරකසභාව විසින් පත්කල ඉහත සඳහන් විනය මණ්ඩල දෙක අපක්ෂපාතීව සිය තීරණ දීමට පියවර ගත යුතුය.

13 වන වගන්තිය

(අ) සාමාජිකත්වය : ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 18 සපිරි ස්ත්‍රී පුරුෂ කාහටත් කිසිම භේදයකින් තොරව අප පක්ෂයේ සාමාජිකත්වය ලබා ගැනීමට සම්පූර්ණ අයිතිය හා අවස්ථාව ඇත්තේය.

(ආ) සාමාජික මුදල් : ඇතුලත් වීමේ ගාස්තුව රු. 10/- යි.

වාර්ෂික සාමාජික මුදල රු. 25/- යි.

පවතින වකවානුව අනුව සාමාජික මුදල සංශෝධනය විය හැකිය.

- යාව ජීව සාමාජිකත්ව සඳහා කැමති පරිදි දායක විය හැකිය.

(ඇ) සාමාජික අයිතිවාසිකම් :

- ඡන්ද බලය : සෑම සාමාජිකත්වයකටම එක ඡන්දයක් හිමිය. තමා සාමාජිකත්වය දරණ ශාඛාවේ දී හෝ කමිටුවේ හෝ සංවිධානය කරන අවස්ථාවලදී පවත්වන සභා රැස්වීම්වල දී, මුලාසනයෙන් විමසා සිටි අවස්ථාවකදී තමන්ට සතුටු ආකාරයට නිදහස් ඡන්දයක් දීමට අයිතිය සෑම සාමාජිකයෙකුටම ඇත්තේය.

(ඈ) සෑම සාමාජිකයෙකුටම ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පක්ෂයේ ඕනෑම තලයකට පත්වීමට හැක්කේය.

## <u>සුවිශේෂ අවස්ථා</u>

I. සෑම අවස්ථාවකදීම පක්‍ෂය වෙනුවෙන් අදාළ දෙපාර්තමේන්තු හෝ පාර්ශවයන් සමඟ ගිවිසුම් වලට හෝ පොරොන්දු වලට හෝ එකඟතාව සඳහා හෝ පක්‍ෂය වෙනුවෙන් අත්සන් කිරීමට බලය ඇත්තේ පක්‍ෂයේ නායකත්වයට පමණි.

II. යම් අවස්ථාවකදී සභාපතිවරයා සමඟ ප්‍රධාන ලේකම්වරයා එවනි කරුණක් වෙනුවෙන් අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළහොත් එකී කරුණු මධ්‍යම කාරක සභාව ඉදිරියට පමුණුවා එහිදී සම්මත කරගත් යෝජනාවකට අනුව (ගනු ලැබූ තීරණ පරිදි) බලය පැවරූ අයගේ අත්සනින් එකී ගිවිසුමට හෝ ලියවිල්ලට හෝ අත්සන් ලබා ගැනීමට සභාපතිවරයාට අවස්ථාවක් ඇත්තේය.

(කෙසේ වෙතත් පක්‍ෂ නායකවරයාට එක ඡන්දයක් වැඩිපුර ඇත්තේය)

III. විධිමත් විනය පරීක්‍ෂණයකින් තොරව කිසිවකුට දරණ නිලයෙන් හෝ සාමාජිකත්වයෙන් හෝ නෙරපීම කළ නොහැක්කේය.

IV. විනය කඩ කිරීමක් පිළිබඳ චෝදනාවක දී එවනි නිලයක් දරණ සාමාජිකයෙකු හෝ සාමාජිකාවක හෝ උසුලන නිලයේ වැඩ තහනම් කිරීමට පක්‍ෂ නායකවරයාට හෝ සභාපතිට බලය ඇත්තේය.

V. මෙම වගන්තියේ IV වැනි උප වගන්තියේ සඳහන් චෝදනාවක් එල්ල වූ පක්‍ෂයේ නිලයක් දරන කාගේ හෝ නිලයේ වගකීම් වලින් අත්හිටුවා සති දෙකක් ඇතුලත මූලික විනය පරීක්‍ෂණයක් පැවැත්විය යුතුය.

ඒ සඳහා විධායක සභාව වෙත රපෝර්තු කළ යුතුය.

ඉන්පසු එකී විනය පරීක්‍ෂණ ක්‍රියා පටිපාටිය විධිමත්ව ඉටු කිරීමට සභාපතිවරයා සහභාගී නොවන කමිටුවලට භාර කළ යුතුය.

VI. විධිමත් විනය පරීක්‍ෂණ කමිටුවල තීරණ එළි දැක්වීමට පෙර මධ්‍යම කාරක සභාව වෙත භාරදිය යුතුය. එකී කරුණු සඳහා කැඳවනු ලැබූ මධ්‍යම කාරක සභාව මෙම විනය කමිටු තීරණය සළකා බලා පක්‍ෂයේ අභිවෘද්ධිය උදෙසා ද චෝදනා ලබා සිටින සාමාජිකයාට අසාධාරණයක් නොවන ආකාරයට සාධාරණ තීන්දුවක් දීමට මධ්‍යම කාරක සභාව ක්‍රියා කළ යුත්තේය.

(ද්වේශ සහගත චේතනා මුදුන් පමුණුවා ගැනීමට මෙම උත්තරීතර සභාව කිසි විටෙක අවස්ථාව නොදිය යුතු අතර, ප්‍රශ්න සමථයකට පත් කිරීම තුලින් පක්‍ෂයේ අනාගත අභිවෘද්ධිය සුරක්‍ෂිත වන බව සනාථ කළ යුතුයි.)

- පක්‍ෂයේ විනය, අභිවෘද්ධිය හා ප්‍රජාවගේ උන්නතිය සඳහා පක්‍ෂයේ යම් යම් තීරණ ගැනීම පක්‍ෂ නායකත්වයට පැවරේ.

(මෙම ව්‍යවස්ථා මාලාවේ ඉංග්‍රිසි හෝ දෙමළ පරිවර්තනවල යම් වෙනසක් හෝ අර්ථ නිරූපනයේ දී වෙනත් අදහසක් හෝ ප්‍රකාශ වේ නම් පක්‍ෂය පිලිගනු ලබන්නේ මෙම සිංහල ව්‍යවස්ථාව මිස, මෙහි පරිවර්තනයක් නොවේ.)

ප්‍රධාන ලේකම්,
ශ්‍රී ලංකා ජාතික පෙරමුණ,
අංක. 34, දෙවන මහල,
හයිලෙවල් පාර,
කොට්ටාව, පන්නිපිටිය.